## 3 පරිච්ඡේදය

# මහාපරාක්‍රමබාහු රජතුමාගේ තුන් නිකා සමගිය

මහාපරාක්‍රමබාහු රජතුමා විසින් සිදු කරන ලද තුන් නිකා සමගිය ශ්‍රී ලංකා ශාසන ඉතිහාසයේ අතිශයින් වැදගත් සිද්ධියකි. වළගම්බා රාජ්‍ය කාලයේ සිට පැවත ආ නිකාය භේදය සමථයකට පත් කිරීමට පෙර නරපතියන් ගත් සියලු වෑයම් නිෂ්ඵල විය. එසේ වෙන කිසි නරවරයෙකුට කළ නොහැකිව තිබූ මෙම භාර දූර කාර්යය සිදු කිරීමෙහිලා මහාපරාක්‍රමබාහු රජතුමා උපයෝගී කරගත් ක්‍රියා මාර්ග සහ එහිලා ක්‍රියාකාරී වූ බලවේග මොනවාදැයි සොයා බැලීම මෙම ලිපියෙහි ප්‍රධාන පරමාර්ථයයි.

තුන් නිකා සමගිය[1] පිළිබඳ වැදගත් ම මූලාශ්‍රය වශයෙන් සැලකෙන **මහාවංසයේ** ඒ හා සම්බන්ධව විස්තර වාර්තා දෙකක් තිබේ. ඉන් පළමු වැන්න 71 වෙනි පරිච්ඡේදයෙහි ද දෙවැන්න 76 වෙනි පරිච්ඡේදයෙහි ද දැකිය හැකි ය.[2]

**මහාවංසයේ** අදාළ කොටස ලියූ කතුවරයා විසින් පරිශීලනය කරන ලද මූලාශ්‍රය දෙකක තිබුණු වාර්තා දෙකක් එලෙසින් ම වාර්තා කිරීම හේතුකොටගෙන තුන් නිකා සමගිය ගැන විස්තර වාර්තා දෙකක් **මහාවංසයට** ඇතුළත් වන්නට ඇති බව ගයිගර් පඬිතුමා පෙන්වා දෙයි.[3] ඇතැම් විට වාර්තා දෙකක් එක ම සිද්ධිය ගැන සඳහන් වන්නේ නිකායන් සමගි කිරීමට ගත් උත්සාහයන් දෙකක් වූ නිසා ද වන්නට ඇත. නිකාය සමගියට ඇතැම් සංඝ සංවිධානවලින් එල්ල වූ දැඩි විරෝධතා හේතුකොටගෙන හෝ වෙන යම්කිසි බාධකයක් ඉදිරිපත් වීම නිසා මුල් වෑයම අත හැර දැමුවාද විය හැකි ය. එසේ නම් 76 වෙනි පරිච්ඡේදයෙන් හෙළි වන්නේ ඒ සියලු බාධක මැඩගෙන

---

1. සාමාන්‍ය ව්‍යවහාරයෙහි 'තුන් නිකා සමගිය' යන්න නිකාය අතර ඇති කළ එකමුතුකමින් යන අර්ථයට විවරණ කළත් සමගිය යන වචනය මෙහි අර්ථවත් වන්නේ නිකාය වශයෙන් බෙදී සිය සියලු භික්ෂූන්ට එක සම්ප්‍රදායක් එනම් මහා විහාර සම්ප්‍රදාය පිළිගන්නට සලස්වා මුල දී පැවති ගැටුම් නැති කොට ශාසනික සාමය ඇති කළ හෙයිනි.
2. **මහාවංශ**, ඒ.පී. බුද්ධදත්ත නායක හිමි, කොළඹ, 1959, 71.4,76.2 (**මවං**). ගයිගර් පඬිතුමා චූලවංශ නමින් සංස්කරණය කළ කොටස් දෙක ද මෙම **මහාවංශ** සංස්කරණයේ අඩංගු වෙයි. **මහාවංශ**, චූලවංශ යන කවර නාමයකින් හැඳින්වුවත් අන්තර්ගත කරුණු අතින් අදාළ සංස්කරණ දෙක අතර වෙනසක් නැත. එහෙත් 40 වැනි පරිච්ඡේදය සහ 44 වැනි පරිච්ඡේදය අතර පරිච්ඡේද දෙකක් අඩු බව සැලකූ ගයිගර් පඬිතුමා ඒ අතර පරිච්ඡේද ගණන් කොට ඇත්තේ 40, 42, 44 වශයෙනි. ඒ අනුව 41 සහ 43 පරිච්ඡේද තිබිය යුතු ඒවා හැටියට සැලකෙයි. බුද්ධදත්ත සංස්කරණයේ අදාළ පරිච්ඡේද එනම් 40, 42, 44 පරිච්ඡේද පිළිවෙළින් 40, 41, 42 හැටියට ගණන් කොට ඇත. මේනිසා මින් දිගට ම මේ සංස්කරණ දෙක අතර පරිච්ඡේද ගණන් ගැනීමේ දී දෙකක වෙනසක් දක්නට ලැබේ. උදා. බුද්ධදත්ත සංස්කරණයේ 42, 43, 44 ආදි පරිච්ඡේද ගයිගර් සංස්කරණයේ 44, 45, 46 ආදි වශයෙන් ගණන් කොට ඇත.
3. **Culavamsa**, II, W. Geiger, translated from the German into English by Mrs. C. Mabel Rickmers, London, 1953, p.107, n.2 (**Cv.tr.**). Gunawardhana, R.A.L.H. **Robe and Plough**, Arizona, 1979, p.314 (**RP.**)